www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ හිටපු මිලිටරි ප්‍රධානියා සිය ජනාධිපති අපේක්ෂකත්වය නිවේදනය කරයි

**Sri Lanka's ex-military chief announces presidential candidacy**

පානිනී විජේසිරිවර්ධන විසිනි
2009 දෙසැම්බර් 2

සති දෙකක් තිස්සේ විපාර්ශ්වික පක්ෂ සමග තිරයට පිටුපසින් ගෙන ගිය උපාමාරුවලට පසුව, ශ්‍රී ලංකාවේ හිටපු ඉහල ම ජෙනරාල් සරත් ෆොන්සේකා තමන් ජනවාරි 26 දා පැවැත්වීමට නියමිත ජනාධිපතිවරනයට තරග කරන බව ඉරිදා නිවේදනය කලේය. ෆොන්සේකාගේ අපේක්ෂකත්වය දිවයිනේ දේශපාලන ජීවිතයට මිලිටරිය සෘජුව ම ඇතුලුවීම සලකුනු කරයි.

හමුදා ප්‍රධානියා ලෙස, ජෙනරාල් ෆොන්සේකා, මැයි මාසයේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයට තුඩු දුන් ම්ලේච්ච යුද්ධය අධීක්ෂනය කලේය. මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් රුදුරු ලෙස පාගා දැමූ ව්‍යවස්ථාව උල්ලංඝනය කල හා පාර්ලිමේන්තුව නොතකා ක්‍රියා කල ජනාධිපති මහින්ද රාජපක්ෂ වටා වූ පාලක දේශපාලන-මිලිටරි කට්ටුවේ ප්‍රමුඛ පුද්ගලයකු ලෙස ෆොන්සේකා ක්‍රියා කලේය.

කෙසේවෙතත්, සිය ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී, ෆොන්සේකා උත්සාහ කලේ, ජනාධිපතිගේ දඩයමට ලක් වූ හා දැන් "පසික්කාට්ටු ආඥාදායකයා"ට අභියෝග කරන, ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයකු ලෙස තමා ඉදිරිපත් කරගැනීමට ය. මෙම මවාපෑම විකාරයකි. යුද්ධය තුල දී, ෆොන්සේකා රාජපක්ෂට උපරිම මට්ටමින් සහාය දුන් අතර, යුද ප්‍රයත්නයට වල කපන බවට මාධ්‍ය විචාරකයන් හෙලාදකිමින්, වඩවඩා ආක්‍රමනික දේශපාලන ක්‍රියාකලාපයක් ඉටු කලේය.

දෙදෙනා අතර තියුනු මතභේද මතුවීමට ඇරඹුනේ එල්ටීටීඊයේ පරාජයෙන් පසුවය. ඒ සාපරාධී යුද්ධය ගෙන ගිය ආකාරය ගැන නොව, ජයග්‍රහනයේ සම්පූර්න කීර්තිය අත්පත් කරගැනීමේ රාජපක්ෂගේ අධිෂ්ඨානය හේතු කොට ගෙනය. ත්‍රිවිධ හමුදාව මත කිසිදු මෙහෙයුම් බලයක් නැති විශේෂයෙන් නිර්මානය කෙරුනු ආරක්ෂක මාන්ඩලික ප්‍රධානී තනතුරට තමන්ට උසස් කිරීමත් සමග තමන් තථ්‍ය වසයෙන් කොන්කෙරුනු බව ෆොන්සේකා කියාපෑවේය. ජනාධිපතිවරනයට තරග කරනු පිනිස ඔහු නොවැම්බර් 16 දා එම තනතුරෙන් ඉල්ලා අස්විය.

එල්ටීටීඊයේ මිලිටරි ජයග්‍රහනයෙන් වාසි ලබා ගනු පිනිස වසර දෙකකට කලින් ජනාධිපතිවරනය කැඳවූ රාජපක්ෂට ප්‍රතිමුඛ වන දේශපාලන ගැටලු ෆොන්සේකාගේ ජනාධිපති අපේක්ෂකත්වය මගින් තව දුරටත් සංකීර්න කෙරී ඇත. යුද්ධයෙන් අවසානයෙන් පසුව, පාලක සභාගය රටේ දරුනු වන සමාජ හා ආර්ථික අර්බුදයෙන් මහජන අවධානය අපසරනය කරනු වස් මිලිටරි ජයග්‍රහනය ගසාකා පලාත් සභා මැතිවරන මාලාවක්ම ජයගෙන තිබේ. යුද්ධයට පිටුබලය දුන් ප්‍රධාන විපාර්ශ්වික පක්ෂ -- එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) -- එහි දී කිසිදු විකල්පයක් ඉදිරිපත් නොකලේය.

යුද වීරයකු ලෙස පෙනී සිටීම මගින් තමන්ට ජයගත හැකි යයි ගනන් බැලූ රාජපක්ෂ දැන් විපක්ෂයේ අපේක්ෂකයා ලෙස හිටපු ජෙනරාල්ට මුහුන දෙයි. ස්වකීය අපේක්ෂකයන් ඉදිරිපත් කරනවා වෙනුවට ෆොන්සේකාට සහාය දීමට එජාප හා ජවිපෙ ගත් තීන්දුව පිලිබිඹු කරන්නේ ඔවුන්ගේ ම දේශපාලන බංකොලොත්කම සහ සහයෝගී පදනම් කඩාවැටීමයි. ආන්ඩුව සමග කිසිදු මූලික මතභේදයක් නැති තතු තුල, මෙම ප්‍රතිවාදී විරුද්ධ පක්ෂ, රාජපක්ෂට අභියෝග කරනු පිනිස විකල්ප "යුද වීරයකුට" ඒකාබද්ධව සහයෝගය දීමට තීන්දු කර තිබේ.

එජාප ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (ශ්‍රීලමුකො) සහ දෙමල ජනතාව මත පාදක ප්‍රජාතන්ත්‍රවාදී මහජන පෙරමුන (ප්‍රමපෙ) ඇතුලු කුඩා පක්ෂ ගනනාවක් සමග මැතිවරන පෙරමුනක් තනාගෙන ඇත. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂකයකු හා රටේ දෙමල හා මුස්ලිම් සුලුතරයකගේ මිතුරකු ලෙස හිටපු ජෙනරාල් පින්තාරු කිරීමේ අසීරු කර්තව්‍යයට මෙම පක්ෂ අත ගසා තිබේ. "මේ රට අයිති සිංහලයන්ට" යන්න තමාගේ බලගතු විශ්වාසය යයි පසුගිය වසරේ කැනඩාවේ පාදක

නැෂනල් පෝස්ට් පත්‍රයට ඔහු පැවසූ අවස්ථාවේ ෆොන්සේකා ස්වකීය වර්ගවාදී ආකල්පය පැහැදිලිව ම ප්‍රකාශයට පත් කලේය.

ෆොන්සේකා ඉරිදා සිය ප්‍රවෘත්ති සාකච්ඡාව පැවැත්වූයේ කොලඹ නගර මධ්‍යයේ පිහිටි හිල්ටන් සුපිරි හොටල් සංකීර්නයේ සුඛෝපභෝගී බාල්නැටුම් ශාලාව තුල ය. විපක්ෂයේ "පොදු අපේක්ෂකයා" ලෙස තමන් රාජපක්ෂට විරුද්ධව තරග කරන බව නිවේදනය කරනු පිනිස ඔහු සැරසී සිටියේ සිංහල දේශපාලනඥයකුගේ නියම ඇඳුම වන සුදු රෙද්දෙන් හා බැනියමෙනි. සිය නාම යෝජනා ඉදිරිපත් කරන්නේ කුමන දේශපාලන පක්ෂය යටතේ ද යන්න ඔහු තවමත් තීරනය කර නැත.

ෆොන්සේකා දේශපාලන පක්ෂයක සාමාජිකයකු නොවේ සහ එබැවින් එහි ප්‍රතිපත්තිවලට හා විනයට යටත් නැත යන්න සැලකිය යුතු අර්ථභාරයක් දරයි. ඔහුගේ සැබෑ බල පදනම මිලිටරියේ නිලධාරි තට්ටුවයි. ඔහු ප්‍රකාශයට පත් කරන්නේ ඔවුන්ගේ අසන්තෘප්තිය හා අසහනයයි. ගැඹුරු වන ආර්ථික හා දේශපාලන වියවුලක කොන්දේසි තුල, ඔහු මතුවන්නේ, පාර්ලිමේන්තුවේ සහයෝගය ඇතුව හෝ නැතුව, පැන නගින මොන යම් හෝ විරුද්ධත්වයක් මඩිමින් පටි තද කර ගැනීමේ පිලිවෙත් රුදුරු ලෙස ක්‍රියාවට දමනු වස් බලගතු විධායක ජනාධිපති ක්‍රමය ගසාකෑමට යන, පාලක ප්‍රභූවේ කොටස්වල පිටුබලය ලබන, ඒකාධිපති මිලිටරි පාලකයකු ලෙසය.

ෆොන්සේකාට නිසැකව ම අවශ්‍ය ක්ෂමාවිරහිත භාවය තිබේ. හමුදාපති ලෙස තමා සිය පොරොන්දුව අකුරට ඉටු කල බව මාධ්‍ය සාකච්ඡාවේ දී ඔහු පාරම්බෑවේය. "එල්ටීටීඊයට එරෙහි යුද්ධය" සිය පසුප්‍රාප්තිකයාට ඉතිරි නොකරන බවටත් එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන්ට මෙම නොවැම්බරයේ දී සිය "මහා වීර දින කතාව" පැවැත්වීමට ඉඩ නොදෙන බවටත් ෆොන්සේකා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට තිබුනි. යුද්ධයේ අවසන් දිනවල දී, හමුදාව ප්‍රභාකරන් ඇතුලු එල්ටීටීඊයේ ඉහල නායකත්වය ඝාතනය කලේය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, ජනවාරි සිට මැයි දක්වා එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට මිලිටරිය එල්ල කල ඉවබවක් නැති බෝම්බ හා ෂෙල් වරුසා මගින් අඩු ගනනේ දෙමල සිවිල් වැසියන් 7,000ක් වත් ඝාතනය කෙරුනි.

"තනි පවුලක -- පෙලපතක හා රජකුගේ -- ඥාති සංග්‍රහ අවශ්‍යතා" ආරක්ෂා කරන බවට ද "ආඥාදායකයකු" ලෙස ක්‍රියා කරන බවට ද ෆොන්සේකා, රාජපක්ෂව හෙලාදුටුවේය. ඔහු එජාප හා ජවිපෙ සමග එක්වූයේ මාස හයක් ඇතුලත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට "පාර්ලිමේන්තුව ශක්තිමත්" කිරීමට පොරොන්දු වෙමිනි. හිටපු ජෙනරාල්ගේ වචන කිසිවෙක් විශ්වාස නොකල යුතුය. ප්‍රජාතන්ත්‍රවාදීන් ලෙස පෙනී සිටීම පිනිස විපාර්ශ්වික දේශපාලනඥයෝ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට පුරුද්දක් වසයෙන් පොරොන්දු වෙති. එහෙත් ඔවුන් බලයට පත් වූ වහාම සිය පොරොන්දු බිඳ දමති.

රාජපක්ෂ සහ ඔහුගේ ක්ෂනික පෙරප්‍රාප්තිකයා වූ චන්ද්‍රිකා කුමාරතුංග යන දෙදෙනාම, ජවිපෙ පිටුබලය සහිතව, විධායක ජනාධිපති ක්‍රමය අවසන් කරන බවට පොරොන්දු වූහ. එහෙත් බලයට පැමිනි වහාම ඔවුහු එම තනතුරේ බලතල මුලුමනින්ම ගසාකෑහ. ජනාධිපති තනතුරට අමතරව, රාජපක්ෂ ආරක්ෂක ඇමති හා මුදල් ඇමති යන ප්‍රධාන තනතුරු ද තමා අත තබා ගෙන සිටී. දැන් බල පැවැත්වෙන හදිසි නීතිය යටතේ, වර්ජන තහනම් කිරීමේ. මාධ්‍ය වාරන පැනවීමේ හා චෝදනා නැතිව පුද්ගලයන් රඳවා ගැනීමේ පුලුල් බලතල ඔහු සතුව ඇත.

වත්මන් "ආඥාදායකයාට" විරුද්ධ බවට ඔහු කරන සියලු කියාපෑම් සම්බන්ධයෙන් ගත හොත්, ෆොන්සේකාගේ ප්‍රධාන පනිවිඩය වන්නේ, රාජපක්ෂ ක්‍රියාවට දැමීමට අපොහොසත් වී ඇති "නීතිය හා සාමය" පිලිබඳ තදබල පිලිවෙත් ක්‍රියාවට දැමීමට අවශ්‍ය ශක්තිමත්, හැකියාවක් සහිත පුද්ගලයා තමා බවයි. තමන් දූෂනය අතුගා දමා පාතාලය ශුද්ධ කොට සමාජයේ " විනය " තහවුරු කරන බවට ඔහු තර්ජනාත්මකව ප්‍රකාශ කලේය. මිලිටරියේ ප්‍රධානිය ලෙස, ඔහු රාජපක්ෂගේ "පාතාලයට එරෙහි යුද්ධය" තුල සහයෝගීව ක්‍රියාකලේය. එම "යුද්ධයේ" ප්‍රතිඵලයක් ලෙස පොලීසිය හා ආරක්ෂක හමුදා විසින් අපරාධකරුවන් යයි කියනු ලැබූ පුද්ගලයන් ගනනාවක් අධිකරන ක්‍රියාවලියෙන් පරිබාහිරව මරා දමන ලදි.

ඔහුගේ ආර්ථික පිලිවෙත් පිලිබඳව ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරුවකු විමසන ලදුව, ෆොන්සේකා එජාපයේ වෙලඳ පොල-හිතැති පිලිවෙත්වලට සිය සහයෝගය පෙන්නුම් කලේ මෙසේ පවසමිනි: "මා විශ්වාස කරන්නේ එජාපයේ ආර්ථික පිලිවෙත රට සෞභාග්‍යය කරා ගෙන යන බවයි. " දක්ෂිනාංශික එජාප 1978 දී ශ්‍රී ලංකාව ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස විවෘත කිරීමේ පිලිවෙතට මුලපිරුවේය. ෆොන්සේකා සඳහන් කල පරිදි, එම වැඩපිලිවෙල දැන් ශ්‍රී ලංකාවේ සියලු ප්‍රධාන පක්ෂ විසින් අනුගමනය කරනු ලැබේ. එය අවසන් වරට බලයේ සිටි 2001 සිට 2004 දක්වා කාල පරිච්ඡේදය තුල දී, එජාප, දිවයින කලාපීය ආයෝජන කේන්ද්‍රයක් බවට පරිවර්තනය කිරීම ද රාජ්‍ය අංශයේ රැකියා. සහනාධාර හා සුභසාධන පිලිවෙත් තියුනු ලෙස කප්පාදු කිරීම ද පිනිස "යලි පුබුදමු ශ්‍රී ලංකා" නමින් ප්‍රසිද්ධ පුලුල් ප්‍රතිව්‍යුහගත සැලසුමක් ක්‍රියාවට දැමීමට උත්සාහ කලේය.

අඛන්ඩව පවතින ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ, ශ්‍රී ලංකාව අද පවතින්නේ ඊටත් වඩා දරුණු තත්ත්වයකය. විදේශ විනිමය අර්බුදයක් වලකාගනු පිනිස එ.ජ. ඩොලර් බිලියන 2.6ක නයක් ඉල්ලා ජූනි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත හැරීමට රාජපක්ෂ ආන්ඩුවට බල කෙරුනි. වැඩෙන විරැකියාව හා කඩා වැටෙන ජීවන මට්ටම් මධ්‍යයේ, තව දුරටත් පුද්ගලීකරනය කිරීම හා රාජ්‍ය වියදම් දරුනු ලෙස කප්පාදු කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැඩි කොන්දේසිවලට ඇතුලත් විය. අවශ්‍ය පටි තද කර ගැනීමේ පිලිවෙත් ක්‍රියාවට දැමීමෙහිලා හෙලත්තාඩු රාජපක්ෂ ආන්ඩුවට හැකියාවක් ඇති බවට මහ ව්‍යාපාරික කොටස් තව දුරටත් විශ්වාස නොකරන අතර ඒවා ක්‍රියාවට දමනු හැකි බලවන්තයකු ලෙස ඔවුහු ෆොන්සේකාට පිටුබලය දෙති.

දෙමල සුලුතරය පිලිබඳ ඔහුගේ පිලිවෙත ගැන විමසන ලදුව, ෆොන්සේකා එජාප පිලිවෙත අනුමත කරමින් කියා සිටියේ, වාර්ගික ගැටුම සම්බන්ධයෙන් රටේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුල අඩංගු පලාත් ස්වයං-පාලනය පිලිබඳ සීමිත විධිවිධානවලට එහා යා හැකි "දේශපාලන විසඳුමකට" තමන් සහයෝගය දෙන බවයි. කම්කරු පන්තිය අන්‍යොන්‍යව සූරාකෑම හා මැඩීම පිනිස මාවත සකසාගනු වස් දිවයිනේ සිංහල හා දෙමල ප්‍රභූ කොටස් අතර බලය බෙදාගැනීමේ එකඟතාවක් සඳහා එජාප කැඳවුම් කර තිබේ. රාජපක්ෂ පිලිබඳව විවේචනශීලී වී ඇති එක්සත් ජනපදය හා යුරෝපීය බලවත්තු ද කලාපීය වියවුලක්, විශේෂයෙන්ම දකුනු ඉන්දියාව තුල, අවුලුවාලීමේ විභවයක් සහිත දිවයිනේ වාර්ගික ආතතීන් ලිහිල් කිරීමේ විධික්‍රමයක් ලෙස, එවන් එකඟතාවකට පිටුබලය දෙති.

පසුගිය වසරේ කැනඩාවේ පාදක නැෂනල් පෝස්ට් පත්‍රයට ඔහු කල වර්ගවාදී ප්‍රකාශ පිලිබඳව විමසූ කල, ෆොන්සේකා එයින් දුරස්ථ වීමට උත්සාහ කරමින් කියාසිටියේ තමන්ගේ ප්‍රකාශ "වැරදි ලෙස උපුටා දක්වා" ඇති බවයි. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව 250,000කට අධික දෙමල සිවිල් වැසියන් සංඛ්‍යාවක් රැඳවුම් මධ්‍යස්ථානවලට ගාල් කිරීමෙහිලා කේන්ද්‍රීය ක්‍රියාකලාපයක් ඉටු කිරීමෙන් පසුව, හිටපු ජෙනරාල් රැඳවියන්ට යම් අනුකම්පාවක් පෙන්නුම් කිරීමට ද උත්සාහ කලේය. එමෙන් ම "නිසි ආරක්ෂාවකින් තොරව" ඔවුන් නිදහස් කිරීමට තමන් විරුද්ධ බව ද ඔහු යලිත් තහවුරු කලේය. කඳවුරු පිලිබඳ විවේචන මැතිවරනයට පෙර අවසන් කරගැනීමට උත්සුක වී සිටින රාජපක්ෂ ආන්ඩුව කරමින් සිටින්නේ හරියට ම මෙයයි: එනම්, ෆොන්සේකාගේ උදව්වෙන් ගොඩනැගූ නිත්‍ය මිලිටරි වාඩිලෑමේ කොන්දේසි තුලට ආපසු යාම පිනිස රැඳවුම් මධ්‍යස්ථානවලින් පිටව යාමට රැඳවියන්ට ඉඩ දීමයි.

හිටපු ඉහලම ජෙනරාල් සහ "ආඥාදායකයා" අතර තරගය, මැතිවරනය හමාරවීමත් සමග ම සූදානම්ව පවතින්නේ කුමක්ද යන්න ගැන කම්කරු පන්තිය වෙත තියුනු අනතුරු ඇඟවීමකි. ශත වර්ෂ කාර්තුවක සිවිල් යුද්ධය තුල දී, ශ්‍රී ලංකාවේ මිලිටරිය, වඩවඩා දේශපාලන ක්‍රියාකලාපයක් ඉටු කර ඇති බලගතු නිලධාරි තට්ටුවක් සහිත ලෝකයේ ඒක පුද්ගල මට්ටමෙන් විශාලතම හමුදාවලින් එකක් බවට පුලුල් ලෙස ප්‍රසාරනය වී තිබේ. රාජපක්ෂ බරපතල ලෙස මිලිටරිය මත වාරු වුනත් ෆොන්සේකා ආරක්ෂක සංස්ථාපිතය ඍජුව ම නියෝජනය කරයි. ජනවාරි 26 දා මැතිවරනයෙන් කවුරු ජයග්‍රහනය කලත් මහ ව්‍යාපාරිකයන් හා විදේශ ආයෝජකයන් විසින් ඉල්ලා සිටිනු ලබන කම්කරු පන්ති විරෝධී පිලිවෙත් ක්‍රියාවට දමනු පිනිස යුද්ධය තුල දී ගොඩනගා ගැනුනු පොලිස්-රාජ්‍ය යාන්ත්‍රනය යොදාගැනීම සම්බන්ධයෙන් මොනම පැකිලීමක් වත් ඔහුට නොතිබෙනු ඇත.

© www.wsws.org